1987

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 9 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 06 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය**

**මිල : ශත 90 යි.** තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1987 අංක 9 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 6 වන දින.]

එල්.ඩී.—ඕ. 54/86.

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 9 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තියේ අන්තිමට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1981 අංක 69 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) යම් කාර්තුවක් සඳහා ව්‍යාපාරයක පිරිවැටුම නිසැක වශයෙන් දැන ගැනීමේ දී කලින් කාර්තුවක් සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද සහ ඒ සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ගෙවනු ලැබ ඇත්තා වූ මුදලක් වින, ඒ කාර්තුව තුළ බොල් ණයක් වී ඇත්තා වූ ඒ ව්‍යාපාරය විසින් දරන ලද යම් බොල් ණයකට සමාන මුදලක් අඩු කරනු ලැබිය යුතු ය.

එසේ වුවද බොල් ණයක් සම්බන්ධයෙන් මේ උපවගන්තිය යටතේ කලින් අඩු කරනු ලැබූ මුදලක් වෙනුවෙන් ඒ ව්‍යාපාරය විසින් භාර ගනු ලැබූ යම් මුදලක් ඒ මුදල් භාරගනු ලැබූවේ යම් කාර්තුවක දී ද ඒ කාර්තුව සඳහා වූ ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"වෙනස් ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු බව.

6. 3 වන වගන්තියේ හෝ 10 වන වගන්තියේ කාර්ය සඳහා ව්‍යාපාරයක පිරිවැටුම තීරණය කිරීමේ දී—

(අ) තැනැත්තකු විසින්, එකම ස්ථානයක හෝ වෙනස් ස්ථානවල පවත්වා ගෙන යනු ලබන සමාන ස්වභාවයක ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු ය; තවද

(ආ) එකම තැනැත්තා විසින් එක් ස්ථානයක පවත්වාගෙන යනු ලබන වෙනස් ව්‍යාපාර එක් ව්‍යාපාරයක් සේ සලකනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ස්වභාවය අනුව නිශ්චය කරනු ලැබීම ද" යන වචන වෙනුවට "ස්වභාවය අනුව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබීම ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ අන්තිමට පහත දක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(9) (2) වන උපවගන්තිය යටතේ තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකුට දෙන ලද දැන්වීමක නියමයන් අනුව කටයුතු කිරීමට ඔහු පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින්—

(අ) ඒ තැනැත්තා මත රුපියල් පන් දහසක් නොඉක්මවන දණ්ඩනයක් පැනවිය හැකි ය; තවද

(ආ)(i) ඒ දඩ ගෙවීමට; සහ

(ii) තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට දෙන ලද දැන්වීමෙහි සඳහන් වන වාර්තාව කොමසාරිස් ජනරාල්වරයාගේ දැන්වීමෙහි සඳහන් යම් කාලයක් ඇතුළත සැපයීමට

ඒ තැනැත්තාට නියම කළ හැකි ය.".

(10) යම් තැනැත්තකු විසින් වාර්තාවක් සැපයීම පැහැරහැරීමට හේතුව තම පාලනයෙන් බාහිර වූ අවස්ථානුගත කරුණු නිසා බවට සහ දණ්ඩනය නියම කිරීමෙන් පසුව තමා විසින් ඒ වාර්තාව සපයා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා වෙත ඔප්පු කරනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කරනු ලැබිය හැකි ය; නැතහොත් අත්හරිනු ලැබිය හැකි ය.

(11) (9) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දැන්වීමට අදාළව 53 වන වගන්තිය යටතේ වරදක් සඳහා වූ අපරාධ චෝදනාවකට ඒ තැනැත්තා යටත් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) මේ පනතේ කුමක් සඳහන් වුවද (8 වන වගන්තියේ අර්ථානුකූලව බැහැර කරන ලද බදුසක් නොවන්නා වූ) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද යම් භාණ්ඩයක් ආනයනය කරන සෑම තැනැත්තකු ගෙන්ම, යම් කාර්තුවක් සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුම 3 වන වගන්තියේ සඳහන් මුදලට වඩා අඩුවුවද, නුවූවද, 7 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව ඔහුගේ පිරිවැටුම සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දක් අයකරනු ලැබිය යුතු අතර, ඒ පිරිවැටුම් බද්ද ප්‍රධාන රේගු අයකැමි විසින් එකතු කළ යුතු ය. මේ වගන්තිය යටතේ පනවනු ලබන බද්ද රේගු ආඥාපනත යටතේ පනවනු ලබන වෙනත් යම් බද්දකට තීරු ගාස්තුවකට හෝ ගාස්තුවකට අමතරව විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "යම් තැනැත්තකු ගෙන්" යන වචන සිට "එම කාර්තුව සඳහා බද්ද ගෙවීමට අපොහොසත් වන විටක" යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"තක්සේරුකරුවකුගේ මතය අනුව යම් තැනැත්තකුගේ පිරිවැටුම් බදු අයකර ගත යුතු වන්නේද ඒ තැනැත්තා විසින් 9 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීම සහ ඒ කාර්තුව සඳහා බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින්, හෝ අතිරේක තක්සේරුව මගින් අයකරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතු ය." යන වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"ඒ අභියාචනය තීරණය කරනු ලබන තෙක්, පිරිවැටුම් බද්ද හෝ එහි යම් කොටසක්, හෝ ගෙවීම කල් තබනු ලැබිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබුවහොත් මිස, මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතු ය. ඒ නියමය කරනු ලැබූ විට කල් තබනු ලැබූ පිරිවැටුම් බද්දෙහි මුදල හෝ එහි කොටස් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය."; තවද

(2) ඒ වගන්තිය අන්තිමට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(12) අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කරනු ලැබීම මත හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ නියමයක් මත (1) වන උපවගන්තිය යටතේ කල් තබනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක, හෝ මුල් තක්සේරුවෙන් අයකරනු ලැබූ පිරිවැටුම් බද්ද වැඩිකරනු ලැබූ අවස්ථාවක, එවැනි යම් පිරිවැටුම් බද්දක් හෝ පිරිවැටුම් බද්දෙහි ශේෂය ගෙවිය යුත්තේ යම් දිනයක ද නැතහොත් ඊට පෙරද, ඒ දිනය නියම කෙරෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචකට දෙනු ලැබිය යුතු ය. එසේ ගෙවනු නොලැබූ යම් පිරිවැටුම් බද්දක් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(13) යම් තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් කර ඇත්තා වූ අවස්ථාවක සහ තක්සේරුව පිළිබඳ දැන්වීමෙහි සඳහන් යම් පිරිවැටුම් බද්දක් ගෙවීම (1) වන උපවගන්තිය යටතේ කල්තබා ඇත්තා වූ අවස්ථාවක, ඒ අභියාචනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් අතරතුර හෝ ඒ අභියාචනය විභාග කිරීමේ දී ඒ තක්සේරුව සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද වශයෙන් යම් මුදලක් ගෙවිය යුතු බවට හෝ ගෙවිය යුතු විය හැකි බවට අභියාචක එකඟ වෙතොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, අභියාචකට දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි සඳහන් දින හෝ ඊට පෙර ඒ මුදල ගෙවීමට විධාන කරනු ලැබිය හැකි ය. එසේ ගෙවනු නොලැබුවා වූ යම් මුදලක් පැහැර හරිනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ “පිරිවැටුම් බද්ද” යන වචන සිට “අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.” යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(20) පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ පනතේ නියමිත කාලසීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් 17 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ එකඟ වී ඇති අවස්ථාවක, හෝ අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, හෝ අභියාචනයේ දී, අවස්ථෝචිත පරිදි, කරන ලද හෝ එකඟ වන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 29අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

“ඇතැම් ගනුදෙනු සහ බැහැර කිරීම් සලකනු නොලැබිය යුතු බව.

29අ. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙහි ප්‍රමාණය අඩුකරන්නා වූ හෝ අඩු කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙනු ලැබිය හැකි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් කෘත්‍රිම බව හෝ ව්‍යාජ බව සහ යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඇත්ත වශයෙන් ම, ක්‍රියාත්මක කරනු නොලබන බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එවැනි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඔහු විසින් සලකනු නොලැබිය හැකි අතර, ඒ අනුව ඒ ගනුදෙනුවට හෝ බැහැර කිරීමට අදාළ පාර්ශ්වයන් තක්සේරු කළ හැකි ය.

මේ වගන්තියෙහි "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක් හෝ සැකැස්මක් ඇතුළත් වේ.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) පැහැර හරිනු ලැබ ඇති පිරිවැටුම් බද්ද පැහැර හරින්නා මත කරන ලද තක්සේරුවක් සම්බන්ධයෙන් නම්, සහ පැහැර හරින්නා විසින් ඒ තක්සේරුවට විරුද්ධව වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති නම්, හෝ පැහැර හරින්නා විසින් සපයන ලද වාර්තාවකට අනුකූලව ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් නම් පැහැර හරින්නා විසින්, ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත, අය කරනු ලැබූ බද්ද සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත විරෝධතාවයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. තවද, 20 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව ස්වකීය තීරණය දෙනු ලැබිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය."

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබූ" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ "නිෂ්පාදකයකු නොවන" යන වචනවල සිට "තමා එළඹුනු" යන වචන දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "සෑම තැනැත්තකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී තමා එළඹුනු, 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ගනුදෙනුවක් නොවන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිති ව ම, පහත දැක්වෙන ශීර්ෂය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් ශීර්ෂයක් ඇතුළත් කිරීම.

"XIV අ වන පරිච්ඡේදය

බැර සහ ආපසු ගෙවීම්".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ "ලියා පදිංචි කළ සාදන්නකු විසින් එම කාර්තුව සඳහා" යන වචන වෙනුවට "ලියා පදිංචි කළ සාදන්නා විසින්, ඒ සෑදීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (iv) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(iv) ප්‍රසංගකරුවකුගේ හෝ කලාශිල්පියකුගේ සේවාවන් සැලසීම සඳහා වූ ගිවිසුමක් ඇතුළු එහෙත් සේවා නියුක්ති ගිවිසුමක් නොඇතුළු සේවය සැලසීම සඳහා වූ යම් ගිවිසුමක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ "මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි" යන වචන සිට "යටත් විය යුතු ය" දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට 9 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියමයක් අනුව කටයුතු කිරීමට පැහැර හැරීමේ වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "තක්සේරුකරු" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"තක්සේරුකරු යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරන ලද දේශීය ආදායම් තක්සේරුකරුවකු අදහස් වන අතර, ඒ පනතේ කාර්ය සඳහා පත් කරන ලද දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ඊට ඇතුළත් වේ.".

(2) "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථකථනයේ (2) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(2) බලය දීමට අදාළ යම් කාරණා සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ල

කින් බලය දෙනු ලැබුවා වූ ද 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද

යම් පුද්ගලයෙක් අදහස් වේ;";

(3) "සමාගම" යන්නෙහි අර්ථ කථනයේ "අදහස් වේ;" යන වචනය වෙනුවට "අදහස් වන අතර, රාජ්‍ය සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) "තැනැත්තා" යන්නෙහි අර්ථ කථනයේ "පුද්ගල මණ්ඩල යක් ඇතුළත් වේ" යන වචන වෙනුවට "පුද්ගල මණ්ඩල යක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ඊට ඇතුළත් වේ; යන වචන ආදේශ කිරීමෙන්

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.